NEW

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

33	S	I

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය-2019.
கல்விப் பொதுத் தராதரப் பத்திர(சாதாரண தர)ப் பரீட்சை
General Certificate of Education (Ord. Level) Examination.

ඉතිහාසය I
வரலாறு I
History I

පෙරහුරු පරීක්ෂණය
மாதிரி வினாத்தாள்
Modal Paper

පැය එකයි.
ஒரு மணித்தியாலம்
One hour.

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්ණවල, දී ඇති (1), (2), (3) ,(4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්ණය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. මහාවංශය ලිවීමෙන් වසර හාරසියයකට පමණ පසුව පාලි භාෂාවෙන් ලියවුනු එහි අර්ථ විවරණය සඳහා සම්පාදිත කෘතිය හඳුන්වන්නේ,
(1) වංසත්ථප්පකාසිනී ය. (2) සිඛවලඳවිනිස ය.
(3) සිහලට්ඨකථා ය. (4) සියබස්ලකර ය.

2. අපේ සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කෙරෙන ජීවමාන සාක්ෂි ඇතුළත් පිළිතුර මින් කුමක් ද?
(1) ආගමික විශ්වාස, ඇදහිලි හා සිරිත් විරිත්. (2) සීගිරි චිත්‍ර, ගල් කණු හා වැව්.
(3) පැරණි චිත්‍ර, මූර්ති හා වැව්. (4) සෙල්ලිපි, ගෘහ නිර්මාණ හා චිත්‍ර.

3. ශ්‍රී ලංකාවේ නොයෙක් ප්‍රදේශ වල ගල්වල කොටා ඇති හක්ගෙඩිය, ගොන්කුරය, ඇත් අඩිය හා විවිධ සත්ව රූප වලින් නිරූපණය කර ඇත්තේ කුමක් ද?
(1) සෞභාග්‍යය. (2) ප්‍රාදේශීය මායිම්.
(3) ස්ථාවරත්වය. (4) රාජ්‍ය අයිතිය.

4. සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරින් තොරතුරු ලබාගැනීමේ දී අතීතය නිවැරදිව දැකීමට නම් විචාර බුද්ධියෙන් යුතුව එම මූලාශ්‍රය පරිශීලනය කළ යුතු වන්නේ,
(1) ඓතිහාසික සිදුවීම් වලට වඩා පසුකාලීන සිදුවීම් ද වාර්තාවීම නිසා ය.
(2) ඓතිහාසික සිදුවීම් වලට වඩා සමකාලීන සිදුවීම් ඇතුලත්වීම නිසා ය.
(3) මේවාහි සඳහන් තොරතුරු බොහෝ විට සත්‍ය නොවන නිසා ය.
(4) මේවාහි කතුවරුන්ගේ රුචි අරුචිකම් ඇතුලත් නොවන නිසා ය.

5. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ පරිසර කලාපයන් තීරණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබ ඇති ප්‍රධාන සාධකය කුමක් ද?
(1) දඩයමෙන් ආහාර ලබාගත හැකි වීම.
(2) ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය.
(3) ස්වාභාවික වෘක්ෂලතා කලාප.
(4) වාර්ෂික වර්ෂාපතන අගයන්.

6. පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූ කාන්තාවන් තමන්ගේ රූ සපුව අලංකාර කර ගැනීමට උනන්දු වූ බවට උඩරංචාමඩම නිවාසයෙන් හමු වූ සාක්ෂියක් නොවන්නේ මින් කුමක් ද?
(1) ඇස් අඳුන් තැබීමට භාවිතා කරන ලෝහ කූරක් ,
(2) ඉන්දියාවෙන් ආනයනය කරන ලද පබළුවලින් සෑදූ ගෙල මාලයක්,
(3) සිරුර වර්ණ ගැන්වීමට භාවිතා කරන ලද කහ හා රතු ගුරුගල් දෙකක්,
(4) පදම් කර පුලුස්සා සකස් කරන ලද මැටි පබළුවක්,

7. ගංඟා නිම්න වලට පිටතින් ආරම්භ වන මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ගංඟා නිම්න තුළට අවතීරණ වන ආකාරය පිළිබඳ ඉතා පැහැදිලි නිදසුන් සපයනුයේ,
(1) වලවේ ගංඟා නිම්නයෙනි. (2) මල්වතු ඔය ආශ්‍රිත ප්‍රදේශයෙනි.
(3) කිරිඳි ඔය නිම්නයෙනි. (4) කැළණි ගංඟා නිම්නයෙනි.

8. පහත I තීරුවේ දැක්වෙන තොරතුරු II තීරුවේ දැක්වෙන සාහිත්‍ය ග්‍රන්ථ අතර සම්බන්ධතාවක් ඇත. I තීරුවේ අනුපිළිවෙළ අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

I තීරුව	II තීරුව
1. පැරණි ගමක දිළිඳු වැසියෙකු ගමිකගෙන් වී මල්ලක් ණයට ගැනීම	A - බුත්සරණ
2. ගමිකයින්, ගෘහපතීන් අතරින් ම පත් වූ අයෙකු බව	B - ධම්පියා අටුවා ගැටපදය
3. අතීතයේ හේන් වගාව සෙහෙන් යනුවෙන් දක්වා තිබීම	C - ජාතකට්ඨකථාව
4. සුප ශාස්ත්‍රයේ දක්ෂ කතුන් "මධුපාචිතා" ලෙස හැඳින්වීම	D - සද්ධර්මලංකාරය
	E - සමන්තපාසාදිකාව

(1) ABCD (2) BCDE (3) CEAB (4) CEDB

9. ශ්‍රී ලංකාව පාලනය කළ රාජවංශ කිහිපයක් ඉතිහාසයේ සඳහන් වේ. ඒ අතරින් ලම්භකරණ පෙළපතට අයත් රජවරු පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වසභ රජු හා පළමුවන විජයබාහු රජු (2) වසභ රජු හා පළමුවන ගජබාහු රජු
(3) පළමුවන ගජබාහු රජු හා ධාතුසේන රජු (4) භාතිකාභය රජු හා වසභ රජු

10. රාජ්‍යත්වය පිළිබඳ ව්‍යවහාර විවිධ වූ අතර සෑම සංකල්පයකින්ම රජුගේ උසස් බව හැඟවීමට උත්සාහ දරා ඇත. එතුළින්, පාලකයා පිළිබඳ ව ජනතාව බලාපොරොත්තු වූයේ මින් කුමක්ද?
(1) ආදර්ශවත්වීම හා ධාර්මික වීම (2) ආක්‍රමණකාරීවීම හා දැඩි තීරණ ගැනීම
(3) පරාර්ථකාමීවීම හා ඍජුබව (4) දැඩි තීරණ ගැනීම හා මෘදු බව

11. නාගපබ්බ විහාරයේ පුරාණ ස්ථූපයේ ධාතු ගර්භයේ තැන්පත් කර තිබූ මහාමේරු ගලේ කැටයමින් හෙළිවන ආර්ථික කටයුත්ත වන්නේ,
(1) ගොවිතැන (2) මැණික් කර්මාන්තය
(3) සත්ත්ව පාලනය (4) ධීවර කර්මාන්තය

12. රජරට ශිෂ්ඨාචාර සමයට අයත් සාහිත්‍ය කෘති පාලි, සංස්කෘත හා සිංහල යන භාෂා වලින් ලියවී ඇති අතර එම කෘති වලට උදාහරණ තුනක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර මින් කුමක්ද?
(1) අනුරුද්ධශතකය, දීපවංශය, බාලාවබෝධය (2) සාරත්ථදීපනී, ජානකීහරණය, සියබස්ලකර
(3) දීපවංශය, සාරත්ථදීපනී, සියබස්ලකර (4) අනුරුද්ධශතකය, ජානකීහරණය, සියබස්ලකර

13. කොණ්ඩවට්ටවාන් ටැම් ලිපියේ සඳහන් පරිදි නිසි කලට සී සෑම නොකරන පුද්ගලයන්ට කලං පහක දඩයක් නියම කිරීමෙන් බලාපොරොත්තු වූයේ කුමක්ද?
(1) පරිසරයේ තිබෙන නොයිඳුල් ගුණය ආරක්ෂා කර ගැනීමයි.
(2) වී අස්වනු ප්‍රමාණය වැඩිකර ගැනීමයි.
(3) කෙත්වතුවල පස සාරවත් කර ගැනීමයි.
(4) වැසි කාලයේ සී සෑමෙන් පස සෝදායාම වලක්වා ගැනීමයි.

14. මහවැලි ගඟ ගලා බසින නිම්නයේ හා ශ්‍රී පාද මාර්ගයේ සංදිස්ථානයක පිහිටි පාලන මධ්‍යස්ථානයක් වූ රාජධානියේ ප්‍රථම පාලකයා වනුයේ,
(1) පළමුවන බුවනෙකබාහු රජුය. (2) දෙවන බුවනෙකබාහු රජුය.
(3) තුන්වන බුවනෙකබාහු රජුය (4) හතරවන බුවනෙකබාහු රජුය.

15. පහත A B C හා D වගන්ති අතරින් පළමුවන විමලධර්මසූරිය රජු මහනුවර රාජධානියේ ආර්ථික දියුණුව පිණිස අනුගමනය කළ පියවරයන් පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?
A - වෙඩිලුණු කර්මාන්තයේ දියුණුවට කටයුතු කිරීම. B - වෙහෙර විහාර අලුත් වැඩියා කිරීම.
C - ගොවිතැන් කටයුතු දියුණු කිරීම. D - උඩරට රාජ්‍ය උරුමය තහවුරු කිරීම.
(1) A හා D (2) A හා C (3) B හා C (4) B හා D

16. උඩරට රාජධානියේ ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහත දැක්වේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයට අයත් නොවන සිදුවීම ඇතුලත් පිළිතුර තෝරන්න.
(1) නායායක්කාර රාජවංශය බලයට පත්වීම.
(2) වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුර පිරිනැමීම.
(3) පෘතුගීසීන් මෙරටින් පළවා හැරීම.
(4) සියම් නිකාය මෙරට ආරම්භ වීම.

17. උඩරට රාජධානියේ ඉඩම් අයිතිය I තීරුවේ ද, බුක්තිය බෙදීයාම II තීරුවේ ද දක්වා ඇත.

I තීරුව	II තීරුව
i. නින්දගම්	A - රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් කළ ඉඩම්
ii. පරවෙණිගම්	B - රදළ ප්‍රධානීන්ගේ සේවය වෙනුවෙන් වෙන්කළ ඉඩම්
iii. ගබඩාගම්	C - දේවාල සඳහා පූජා කළ ඉඩම්.
	D - ගම්වැසියන් පාරම්පරිකව බුක්තිවිදි ඉඩම්

I තීරුව I I තීරුව හා ගැලපූ විට නිවැරදි පිළිතුර මින් කුමක්ද?

(1) A B C (2) B C D (3) B D A (4) A D B

18. පෘතුගීසීන් මෙරටට පැමිණි අවධියේ යාපනයේ පාලකයා ලෙස කටයුතු කළේ මින් කවුරුන්ද?

(1) ආරියචක්‍රවර්ති (2) සංකිලි (3) පරරාජසේකරම් (4) පුවිරාජපණ්ඩම්

19. දෙවන රාජසිංහ රජු විසින් ලන්දේසීන් මෙරටට කැඳවා ගැනීමේ අරමුණු දෙක වන්නේ මින් කවරක්ද?

(A) වෙළඳ ද්‍රව්‍ය ඒකාධිකාරී අයිතිය ලන්දේසීන්ට ලබා දීම.
(B) ලන්දේසී ආධාර ලබාගෙන පෘතුගීසීන් ලංකාවෙන් නෙරපීම.
(C) ලන්දේසින්ට උඩරට පාලන බලය ලබා දීම.
(D) පෘතුගීසීන් යටතේ තිබූ ප්‍රදේශ උඩරටට ආදාගෙන නිදහස් ලංකාවක් බිහිකිරීම.

(1) A හා B (2) B හා D (3) B හා C (4) C හා D

20. පහත සඳහන් ප්‍රකාශ අතරින් දේශීය වෙළඳාම සම්බන්ධවන ප්‍රකාශ තෝරන්න.

(A) ලන්දේසීන්ට අයත් මුද්‍රාවක් හම්බන්තොටින් සොයාගෙන තිබීම.
(B) සීගිරියේ බටහිර ජල උද්‍යානයේ සෙල්ලිපියක "අබලවපර"නමින් සියඹලා වෙළෙන්දෙකු හඳුන්වා තිබීම.
(C) බොවන්තෙගල නම් ස්ථානයේ සෙල්ලිපියක කාම්බෝජවරුන්ගේ මහා වෙළඳ සංවිධානයක් ගැන සඳහන් වීම.
(D) සොරබොරවැව ටැම්ලිපියේ ගෝපිටිගමුව වෙළඳ පළ ගැන සඳහන් වීම.

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

21. ශ්‍රී ලංකාවට ව්‍යවස්ථාදායක සභා, විධායක සභා හඳුන්වා කොමිසම් යෝජනාව කුමක් ද?

(1) ද මියුරන් (2) කෝල්බෲක් (3) ඩොනමෝර් (4) සෝල්බරි

22. පහත සඳහන් කරුණු අතරින් බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම වැඩි ආදායමක් ලබා ගැනීම සඳහා ලංකාවේ අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(A) බදු එකතු කිරීම සඳහා අවුමිල්දාර්වරුන් පත් කිරීම
(B) කුරුඳු සඳහා අයකළ තීරුබද්ධ වැඩි කිරීම.
(C) මුදලින් බදු ගෙවීමේ ක්‍රමයක් ආරම්භ කිරීම.
(D) ලියකියවිලි වලට අයකරන මුද්දර ගාස්තු වැඩි කිරීම.

(1) A හා C (2) A හා D (3) B හා C (4) B හා D

23. 1815 දී රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුවරයා උඩරටට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීමට ආසන්න හේතුව වශයෙන් යොදාගන්නේ මින් කුමක්ද?

(1) උඩරට සමඟ වෙළඳ ගිවිසුමක් ඇතිකර ගැනීමට බ්‍රවුන්රිග් දැරූ උත්සාහය අසාර්ථක වීම.
(2) මුහුදුබඩ ප්‍රදේශයෙන් උඩරටට ගිය වෙළඳුන් පිරිසකගේ අත් කන් කපා ඔවුන් එළවා දැමීම.
(3) උඩරට රාජ්‍යයේ සම්ප්‍රදායන්ට අයත් නොවූ ද ඉතා අමානුෂික වූද දඬුවම් රජු ක්‍රියාත්මක කිරීම.
(4) ඇහැළේපොලගේ බිරිඳ හා දරුවන් ඉතා අමානුෂික ලෙස මරා දැමීම.

★ පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඇසුරින් අංක 24 හා 25 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පිළිමතලව්වේ මහාදිකාරම් මරණීය දණ්ඩනයට ලක්වීම.
B - ද්විත්ව පාලනය ආරම්භවීම.
C - මහනුවර මඟුල් මඩුවේ දී උඩරට ගිවිසුම අත්සන් කිරීම.
D - ජෝන් ඩොයිලි උඩරට සමඟ සබඳතා ගොඩනගා ගැනීම.

24. ඉහත සිදුවීම්වල නිවැරදි ඓතිහාසික අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) B,A,C හා D (2) B,C,A හා D (3) B,D,A හා C (4) C,B,A හා D

25. C අක්ෂරයෙන් දැක්වෙන ප්‍රකාශය හා සම්බන්ධ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා කවුද?

(1) ෆෙඩරික් නෝත් (2) තෝමස් මේට්ලන්ඩ් (3) ටොරින්ටන් සාමි (4) රොබට් බ්‍රවුන්රිග්

26. - අනගාරික ධර්මපාලතුමා
- වලිසිංහ හරිස්චන්ද්‍රතුමා
- ජෝන්ද සිල්වා මහතා
- පියදාස සිරිසේන මහතා

ශ්‍රී ලංකා පුනරුද ව්‍යාපාරයේ දී ඉහත සඳහන් පුද්ගලයන් ක්‍රියාකළ ආකාරය පිළිබඳව දියහැකි පොදු නිගමනය වන්නේ,

(1) බෞද්ධ පොත්පත් රචනා කිරීම තුළින් ආගමික නැඹුරුවක් ඇති කිරිමයි.
(2) දේශානුරාගය හා ජාත්‍යාලය වර්ධනය කිරීමයි.
(3) බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි.
(4) නාට්‍ය මඟින් ජනතාව තුළ දේශානුරාගය ඇති කිරීමයි.

27. පහත I හා II තීරු යටතේ දක්වා ඇති ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා යෝජනා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

I තීරුව		II තීරුව	
1.	කෝල්බෲක් ප්‍රතිසංස්කරණ	A	අග්‍රාණ්ඩුකාර තනතුර හඳුන්වාදීම
2.	කෲව් මැකලම් ප්‍රතිසංස්කරණ	B	සීමිත ඡන්ද බලය හිමිවීම.
3.	ඩොනමෝර් ප්‍රතිසංස්කරණ	C	අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම
4.	සෝල්බරි ප්‍රතිසංස්කරණ	D	සර්වජන ඡන්ද බලය ලැබීම
		E	ප්‍රථම වතාවට නිල නොලත් පිරිස බහුතරයක් වීම

(1) C A B E (2) C B A D (3) C B D A (4) E A C D

28. I තීරුවේ භෝග වගාවන් ද, II තීරුවේ පර්යේෂණායතනයන් ද දැක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

I තීරුව	II තීරුව
1. රබර්	A - ලුණුවිල
2. තේ	B - මාතලේ
3. පොල්	C - තලවකැලේ
4. සුළු අපනයන බෝග	D - අගලවත්ත
	E - මහ ඉලුප්පල්ලම

(1) A D C B (2) B A D C (3) D B C A (4) D C A B

29. මෙරට බිහිවූ දේශපාලන පක්ෂ අතරින් වඩාත් පැරණිම පක්ෂයේ නායකත්වය දැරූ පුද්ගලයා කව්රුන්ද?
(1). ඒ.ඊ. ගුණසිංහ මහතා.
(2). ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා.
(3). දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහතා
(4). එස්.ජේ.වී. චෙල්වනායගම් මහතා.

★ ප්‍රශ්න අංක 30 සඳහා පිළිතුරු ලිවීමට පහත වගන්ති උපයෝගී කොට ගන්න.
A – ලංකාව යනුවෙන් හැඳින්වූ මෙරට ශ්‍රී ලංකාව ලෙස හැඳින්වීම.
B – සමානුපාතික නියෝජන ක්‍රමය හැඳින්වීම
C – ශ්‍රී ලංකාව ජනරජයක් බව පිළිගැනීම
D – මූලික මිනිස් අයිතිවාසිකම් විස්තරාත්මකව විග්‍රහ කිරීම.

30. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(2) B හා C වගන්ති දෙකම සත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර D අසත්‍ය වේ.
(4) B සත්‍ය වන අතර C අසත්‍ය වේ.

31. ජාතික වැදගත්කමකින් යුත් කරුණක් සම්බන්ධව සෘජුවම මහජන මතය ලබාගන්නා මැතිවරණ ක්‍රමය වන්නේ,
(1) ජනමත විචාරණය (2) පළාත් පාලන මැතිවරණය
(3) මහ මැතිවරණය (4) ප්‍රාදේශීය සභා මැතිවරණය

32. පහත දැක්වෙන්නේ පුනරුද සමයේ සිටි ලේඛකයන් කිහිප දෙනෙකි.
A – අලිගියරි ඩාන්ඩේ.
B – පෙට්රාක්.
C – ෆ්‍රැන්සිස් බේකන්.
D – විලියම් ෂේක්ස්පියර්.
E – තෝමස් මුවර්.

මොවුන් අතුරින් "ලෝරාට සැහැලිකම්" හා "ඩිවිනා කෙමීඩියා" නැමැති කාව්‍ය ග්‍රන්ථ රචනා කළ කතුවරුන් දෙදෙනා ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A, B (2) A,E (3) B,A (4) C,D

★ පහත වගුවේ A සිට I තෙක් තොරතුරු ඇසුරෙන් 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පුද්ගලයා	නිර්මාණය	ක්ෂේත්‍රය
A - රේමිස් හාග්‍රව්ස්	D - වාෂ්ප එන්ජිම	G - වානේ නිපදවීම
B - හෙන්රි බෙසමර්	E - ජෙනී යන්ත්‍රය	H - බලශක්ති උත්පාදනය
C - ජේම්ස් වොට්	F - විවෘත උදුන් ක්‍රමය	I - පේෂ කර්මාන්තය

33. බලශක්ති උත්පාදනය සඳහා වඩාත් විධිමත් යන්ත්‍රයක් නිපදවූ පුද්ගලයා හා නිර්මාණය ඇතුළත් අක්ෂර යුගලය වන්නේ,
(1) A හා E (2) A හා D (3) B හා F (4) C හා D

34. ජෙනී යන්ත්‍රය නිපදවූ පුද්ගලයා සහ එය අයත් කර්මාන්ත ක්ෂේත්‍රය දැක්වෙන අක්ෂර යුගලය තෝරන්න.
(1) A හා I (2) B හා G (3) A හා H (4) C හා I

35. වගා ලෙඩ රෝග ව්‍යාප්තිය අවම කර ගැනීමටත් වැඩි ඵලදාවක් ලබා ගැනීමටත් අනුගමනය කරන ලද පරිසර හිතකාමී ක්‍රමශිල්පය මින් කවරක්ද?
(1) රසායනික පොහොර භාවිතය (2) සාම්ප්‍රදායික ක්‍රමශිල්ප භාවිතය
(3) ශෂ්‍ය මාරු ක්‍රමය (4) කෘමිනාශක භාවිතය

36. ලෝකයේ කැපී පෙනෙන විප්ලව හා සම්බන්ධ පහත දැක්වෙන තොරතුරු අතරින් ඇමරිකානු විප්ලවයට පමණක් අදාළ වන තොරතුරු දෙකක් දැක්වෙන අක්ෂර යුගලය තෝරන්න.

A – ටෙනිස්පිටියේ දිව්රුම.
B – කෙරෙන්ස්කි ලබයට පත්වීම.
C – බොස්ටන් තේ සාදය.
D – බැස්ටිලයට පහර දීම.
E – නියෝජිතයින් නැතිනම් බදුන් නැත.
(1) A හා B (2) A හා D (3) C හා E (4) D හා E

★ පහත A සිට D දක්වා ඇති ප්‍රකාශ ඇසුරෙන් 37 සිට 39 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A නාසිවාදය
හිට්ලර්

B කාර්මීකරණය
පරිසර දූෂණය

C දෙවන ලෝක සංග්‍රාමය
ලුසිටානියා නැව ගිල්වීම

D ජාතීන්ගේ සංගමය
දෙවන ලෝක සංග්‍රාමය

37. පළමු වැන්නේ වැඩිවීම දෙවැන්නේ ඉහළයාමට හේතුවන බව පෙන්වන පිළිතුරු යුගලය මින් කුමක්ද?
(1) A (2) B (3) C (4) D

38. පළමුවැන්න හා දෙවැන්න අතර කිසිම සම්බන්ධයක් නොපෙන්වන පිළිතුරු යුගලය කුමක්ද?
(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්න අසාර්ථකවීම දෙවැන්න ඇතිවීමට හේතු වූ පිළිතුරු යුගලය කුමක්ද?
(1) A (2) B (3) C (4) D

40. ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග අතුරින් ශ්‍රී ලංකාව දායක වන්නේ මින් කවර කාරියකටද?
(1) ආරක්ෂක මණ්ඩලයේ මැදිහත් වීම (2) ආර්ථික සම්බාධක පැනවීම
(2) සාම සාධක හමුදා යැවීම (4) න්‍යෂ්ටික අවි සීමා කිරීම.

***